# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2251/30 - 2021 ඔක්තෝබර් මස 26 වැනි අඟහරුවාදා - 2021.10.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා. කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/34

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායක් ස්ථාපනය කිරීම.

1. පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ
2. මහාචාර්ය දයානන්ද බණ්ඩා මැතිතුමා
3. මහාචාර්ය ශාන්තිනන්දන විජේසිංහ මැතිතුමා
4. මහාචාර්ය සුමේධ සිරිවර්ධන මැතිතුමා
5. එන්.ජී. සුජීව පණ්ඩිතරත්න මැතිතුමා
6. නීතිඥ ඉරේෂ් සෙනෙවිරත්න මැතිතුමා
7. නීතිඥ සංජය මාරඹේ මැතිතුමා
8. එරන්ද නවරත්න මැතිතුමා
9. පානි වැවල මැතිතුමා
10. මවුලවි මොහොමඩ් මැතිතුමා
    ගාල්ල උලමා සභාව
11. කථිකාචාර්ය මොහොමඩ් ඉන්තිකාබ් මැතිතුමා
12. කලීල් රහුමාන් මැතිතුමා
13. අසීස් නිසාර්දීන් මැතිතුමා


1A - G 34909 — 370 (2021/10)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද දැක්වෙන පරිදි නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුතු බව අවධානයට ලක් කරමින් ද,

එහිම, ජාතිය, ආගම, කුලය හෝ වෙනත් සාධකයක් මත කිසිදු පුරවැසියෙකු නීතියේ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුතු බව මූලික අයිතිවාසිකම් යටතේ දක්වා ඇති හෙයින් ද,

ශ්‍රී ලංකාව තුළ එක රටක්, එක නීතියක් යන සංකල්පය ක්‍රියාත්මක කිරීම, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මානුෂීය සාරධර්ම සාක්ෂාත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස පිළිඹිබු වන හෙයින් ද,

සියලුම පුරවැසියන් නීතිය ඉදිරියේ සමාන ලෙස සළකන බව තවදුරටත් තහවුරු කළ යුතු හෙයින් ද,

1. පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ
2. මහාචාර්ය දයානන්ද බණ්ඩා මැතිතුමා
3. මහාචාර්ය ශාන්තිනන්දන විජේසිංහ මැතිතුමා
4. මහාචාර්ය සුමේධ සිරිවර්ධන මැතිතුමා
5. එන්.ජී. සුජීව පණ්ඩිතරත්න මැතිතුමා
6. නීතිඥ ඉරේෂ් සෙනෙවිරත්න මැතිතුමා
7. නීතිඥ සංජය මාරඹේ මැතිතුමා
8. එරන්ද නවරත්න මැතිතුමා
9. පානි වැවල මැතිතුමා
10. මවුලවි මොහොමඩ් මැතිතුමා
    ගාල්ල උලමා සභාව
11. කථිකාචාර්ය මොහොමඩ් ඉන්තිකාබ් මැතිතුමා
12. කලීල් රහුමාන් මැතිතුමා
13. අසීස් නිසාර්දීන් මැතිතුමා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරන්දර ගෝඨාභය රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා එක රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් මතු දැක්වෙන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙයින් පත් කරමි.

1. ශ්‍රී ලංකාව තුළ එක රටක්, එක නීතියක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කර ඒ සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම
2. අධිකරණ අමාත්‍යාංශය විසින් මේ වන විට මෙයට අදාළව සකස් කර ඇති නීති කෙටුම්පත් හා සංශෝධනයන් අධ්‍යයනය කොට ඒවායේ යෝග්‍යතාවය හා සුදුසු සංශෝධන වේ නම් ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම හා යෝග්‍ය පරිදි අදාළ කෙටුම්පතට ඇතුළත් කිරීම

තවද, පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමින් වහන්සේ පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සභාපති ලෙස පත් කරමි.

ජනාධිපති ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ජීවන්ති සේනානායක මැතිතුමිය, උක්ත කාර්ය සාධක බලකායේ ලේකම් ලෙස පත්කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටු කරලීමට අදාළව අවශ්‍ය පරිදි කරුණු සොයා බැලීමට සහ උපදෙස් නිකුත් කිරීමට උක්ත ජනාධිපති කාර්ය සාධක බලකාය වෙත මම මෙයින් බලය පවරමි.

තවද, පෙරකී බලකායේ සාමාජිකයින් වන ඔබ අවම වශයෙන් මසකට වරක් මා හට වාර්තා ඉදිරිපත් කිරීමටත්, අවසන් වාර්තාව 2022 පෙබරවාරි මස 28 වැනි දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කිරීමටත් මෙයින් නියම කරමි.

තවද, මෙම ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු

උපදෙස්වලට අනුකූලව ක්‍රියා කළ යුතු යැයිද, ලබාදිය යුතු සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියලුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙර කී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කරන හා පැහැර හරින සියලු අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ ඔක්තෝබර් මස 26 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.